○ 1 වන කලාපය ○ 6 වන වෙළුම ○ 2008, දෙසැම්බර්

## මෙවර කලාපයෙන්



සමාජ විද්‍යාඥයින්ගේ සංගමයේ පුස්තකාලය ..........................1


නැගෙනහිර කිරි නිෂ්පාදනයට වෙළඳපොළක් .........................2


මත්පැන් දුරලීමට කාන්තාවන්ගේ සහාය ..........................3



# කැඩපත

දැනුම ඔප් නංවනු වස්


# සමාජ විද්‍යාඥයින්ගේ සංගමයේ පුස්තකාලය



සමාජ විද්‍යාඥයින්ගේ සංගමයේ ආරම්භයත් සමගම එහි පුස්තකාලය ද ස්ථාපිත වී ඇත. මූලිකව පොත්, වාර සඟරා, පුවත්පත් යනාදියෙන් සමන්විත වී තිබූ මෙම පුස්තකාලයේ 1991 දී පුස්තකාලාධිපතිනිය වශයෙන් සේවය කරන ලද්දේ බී. පී. කේ. ලිලානි පුෂ්පකුමාරි මෙනෙවියයි.

එවකට පුස්තකාලය මූලික වශයෙන් භාවිත කරන ලද්දේ මෙම සංගමයේ සාමාජිකයන් පමණකි. 1992 වර්ෂයේ දී පරිහරණය කරන්නවුන්ගේ පහසුව සඳහා මෙහි එකතුව වෙන්කරන ලද එකතුවක් වශයෙන් වර්ගීකරණය කරන ලදී.

- ශ්‍රී ලංකා එකතුව
- ස්ත්‍රී පුරුෂ සමාජභාවී එකතුව
- සාමාන්‍ය එකතුව

**ශ්‍රී ලංකා එකතුව**
මෙහි ශ්‍රී ලංකාව පිළිබඳව ලියැවුණු ඉතා වටිනා කෘති 3000ක පමණ ප්‍රමාණයක් ඇත. ශ්‍රී ලංකාවේ දී ප්‍රකාශ කරන ලද හෝ විදේශ රටවල දී ප්‍රකාශයට පත්කරන ලද හෝ කෘතීන් ඊට ඇතුළත්ය.

**ස්ත්‍රීපුරුෂ සමාජභාවී එකතුව**
විශේෂයෙන්ම ස්ත්‍රීන්ට අදාළ කාරණා පිළිබඳ එකතුවක් වශයෙන් දැක්විය හැකි මෙහි වැඩි ප්‍රමාණයක් මහාචාර්ය කුමාරි ජයවර්ධන මහත්මිය කරන ලද පරිත්‍යාගවල එකතුවකි. මෙහි වර්ග කිරීම විශ්ව දශම ක්‍රමයට වුවත් මෙම එකතුව රාක්කගතකර ඇත්තේ ඉංග්‍රීසි අකාරාදිය අනුවය. මෙහි කෘති 1500ක පමණ ප්‍රමාණයක් ඇතුළත්ය.

**සාමාන්‍ය එකතුව**
ශ්‍රී ලංකා එකතුවට හෝ ස්ත්‍රීපුරුෂ සමාජභාවී එකතුවට හෝ අදාළ නොවන පොත් මෙම එකතුවෙහි තැන්පත් කර ඇත. එසේම මෙම එකතුවෙහි කෘති 2000ක පමණ ප්‍රමාණයක් ඇතුළත්ය. මෙම එකතුව;

- සාමය
- ගැටුම් අධ්‍යයනය
- වාර්ගික අධ්‍යයනය

වශයෙන් උප එකතූන්වලට වෙන් කර ඇත.

**දමිළ එකතුව**
මෙම එකතුව විශාල නොවූව ද සමාජ විද්‍යාඥයිනගේ සංගමය මගින් ප්‍රකාශයට පත් කරන ලද හා වෙනත් සංවිධාන කිහිපයකන් පළ කරන ලද දමිළ ප්‍රකාශන වෙයි.

**වාර සඟරා එකතුව**
මේ අතර පහත සඳහන් එකතූන් වේ.

- Economic Review Vol.01 සිට Vol.19 දක්වා (1975-94) බඳින ලද එකතුව
- Economic & PoliticalWeeklyVol. xxiii-Vol.xxxiii (1988-98) දක්වා බඳින ලද එකතුව
- Lanka Guardian Voi.1-Vol.20 (1996-98) දක්වා බඳින ලද එකතුව

ප්‍රවාද ඉංග්‍රීසි සහ සිංහල මුල සිට මේ දක්වා කාණ්ඩ වශයෙන් වෙන් වෙන්ව බැඳීම් කර ඇත. මේ අතර ඉංග්‍රීසි *'ප්‍රවාද'* සඟරාවේ නව නාමය වන *'Polity'* කලාප ද මේ දක්වා බැඳීම් එකතුවක් ලෙස සකස් කර ඇත.

මෙම පුස්තකාලය සමාජ විද්‍යාව පිළිබඳ විෂය හදාරන විශ්ව විද්‍යාල සිසුන්ගේ පරිහරණයට පමණක් මුල්දී සීමා වුව ද විවිධ සමාජයීය විද්‍යාවන්ට අදාළ උසස් පාඨමාලා හදාරන සිසුන් වෙත දැන් සාමාජිකත්වය විවෘත කර ඇත.

2004 වසරේ සැප්තැම්බර් සිට පුස්තකාලයේ පුස්තකාලාධිපතිවරයා ලෙස එම්. එම්. රෝහණ වසන්ත පත් වූ අතර එතැන් පටන් ඔහුගේ අධීක්ෂණය යටතේ එය ක්‍රියාත්මක විය. එවකට ජාතික පුස්තකාලයේ ඒකාබද්ධ සුචියට දායකත්වය සපයමින් සුචිකරණ දත්ත සැපයීමේ ප්‍රතිඵලයක් වශයෙන් ISIS පුස්තකාල දත්ත පරිගණක මෘදුකාංගය භාවිත කරමින් පරිගණක ගත කිරීම ආරම්භ කොට තිබූව ද දත්ත ගොණු මැක-ියාම හේතුවෙන් අතරමග නැවතී තිබූ පුස්තකාල දත්ත පරිගණක ගත කිරීම CDS/SSIS මෘදුකාංගය භාවිත කරමින් නැවත ආරම්භ කරන ලදී.

**විශේෂ පුස්තකාල එකතු**

*සිව්වන පිටුවට...*



# නැගෙනහිර කිරි නිෂ්පාදනයන්ට නව වෙළඳ පොළක්!

වල්ඩ් කන්සර්න් ශ්‍රී ලංකා කිරි නිෂ්පාදන වැඩ සටහන මගින් නැගෙනහිර පලාතේ කුඩා පරිමාණ කිරි ගොවීන් බටහිර පලාතේ කිරි වෙළඳ පොළ සමග සම්බන්ධ කිරීම සිදු කරයි. මෙම වැඩ සටහන සඳහා යූඑස් ඒඩ්, සීඩා, ටියර් ෆන්ඩ් නවසීලන්තය හා International Ministries of American Baptist Churches යන ආයතන ආධාර සපයයි. නැගෙනහිර ප්‍රදේශයේ කිරිගොවීන් අතරින් බොහෝ දෙනෙකු මුහුණ පාන ගැටලුවක් වන්නේ ඔවුනට අවශ්‍ය යටතලපහසුකම් හා අඛණ්ඩව කිරි මිලදී ගන්නන් නොමැති වීමයි. මේ අනුව 2007 වසරේ මාර්තු මස මිල්කෝ ආතනය හා අත්වැල් බැඳ ගත් වල්ඩ් කන්සර්න් ආයතනය මෙම ගොවීන්ගේ යටිතලපහසුකම් සපයාදීමටත් ගොවි සමූපකාර ධාරිතාවන් වර්ධනයටත් පෙරමුණ ගත්තේය. මීට ශීතකළ කිරි එක්රැස් කිරීමේ මධ්‍යස්ථාන හා දෛනිකව නැවුම් කිරි එක් රැස් කිරීම අයත් වේ.

මේ වන විට ප්‍රාදේශීය කිරි එක්රැස් කිරීමේ මධ්‍යස්ථාන දෙකක් ඉදිකර ඇති අතර ඉන් එකක් මඩකලපුවෙහි ද අනෙක ත්‍රිකුණාමලයේ ද පිහිටා ඇත. මීට අමතරව, කුඩා ශීතකරණ සහිත මධ්‍යස්ථාන තුනක් ගොවීන් සිටින ප්‍රජාවෙහිම ඉදිකර ඇති අතර තවත් එවන් මධ්‍යස්ථාන දෙකක් 2008 දෙසැම්බර් මාසයේ ද 2009 ජනවාරි මාසයේ ද ස්ථාපිත කිරීමට නියමිතය. සමස්ථයක් ලෙස කිරි ගොවීන් 2,000කට අධික සංඛ්‍යාවක් වෙළඳ පොළ සමග සම්බන්ධ කර ඇත. මෙහි ප්‍රතිඵලයක් ලෙස එම ගොවීන්ගේ ආදායම දෙගුණ වී ඇත (ඇතැම් ප්‍රදේශයන්හි එය තුන් ගුණය දක්වා ඉහළ ගොස් ඇත). මෙය මෙම පවුල් දරිද්‍රතාවයෙන් මුදවා ගැනීමට ප්‍රමාණවත්ය.

**අනාගත කිරි නිෂ්පාදන කටයුතු**

තවත් මධ්‍යස්ථාන 6ක් ඉදිකිරීම මගින් ප්‍රජා යටිතලපහසුකම් වර්ධනය කිරීම සඳහා වර්ල්ඩ් කන්සර්න් ආයතනය ආධාරකරුවන් වෙත ප්‍රවේශ වෙමින් සිටී. එමගින් ගොවීන්ගේ යෙදවුම් වැඩි දියුණු කිරීමටද අපේක්ෂා කෙරේ. අනෙක් ප්‍රදේශයන් හා සසඳන විට නැගෙනහිර ගොවිපලක කිරි නිෂ්පාදනය 25%කින් අඩු වන අතර මෙම ගොවිපල හි යෙදවුම් සඳහා ද ආධාර සැපයීම අවශ්‍ය බව ආයතනය විශ්වාස කරයි. උසස් වර්ගයේ ගවයින්, කෘතීම සිංචනය, සත්ව රැකවරණය හා ඖෂධ, උසස් පෝෂණය, හා අඛණ්ඩ ජල මූලාශ්‍ර මෙම යෙදවුම් සඳහා අයත් වේ. වෙළඳ පොළ ප්‍රවේශය හා ඵලදායී ගොවිපළ යෙදවුම් මගින් උපරිම නිමවුමක් ලබා ගත හැකි වනු ඇත.

**සාමය ගොඩ නැගීම**

තාක්ෂණික සහායට අමතරව, ගොවීන් හට උඩරට කිරි නිෂ්පාන යටිතලපහසුකම් හා ඔවුන්ගේ කිරි අලෙවිය ට පෙර සකසන ආකාරය නැරඹීම සඳහා චාරිකාවන් ද වර්ල්ඩ් කන්සර්න් ආයතනය විසින් සලසා දී ඇත. මෙහිදී බහු වාර්ගික අසල්වාසී ගොවි කණ්ඩායම් එකට එක්ව නුවරඑළිය, හා මහනුවර ප්‍රදේශයන්හි කිරි නිෂ්පාදනාගර අධ්‍යයනය මෙන්ම සංස්කෘතික ස්ථාන නැරඹීම ද සිදුවේ. මෙම චාරිකාවන් සඳහා ආරක්ෂාව සැපයීමට සිවිල් ආරක්ෂක නිලධාරීන්ගේ නොමඳ සහාය ලැබේ. සහභාගීවන්නන්ට ප්‍රායෝගික සාමයගොඩ නැගීමේ වැඩමුළු සඳහා සහභාගී වීමටද ඔවුන්ගේ මූලික අයිතිවාසිකම් පිළිබඳ උගැනීමටද ඔවුන්ගේ අසල්වාසීන් සමඟ සම්බන්ධතා පවත්වා ගැනීමටද අවස්ථාව සැලසේ. මෙය බොහෝ ගොවීන් සඳහා නොමැකෙන මතකයකි. එච්චිලම්පත්තු ප්‍රදේශයේ එක් සිංහල ගොවියෙකු ඔහුගේ අසල්වාසී ගොවියෙකු අමතා "දුකේදියි සැපේදියි දෙකේදිම අපි ඕගොල්ලන්ව බලන්න එන්නම්." යැයි පැවසූයේ මෙම සමස්ථ වැඩ සටහනේහිම අරුත පිළිබිඹු කරමිනි.

**අනෙකුත් වැඩ සටහන්**

සුනාමි ව්‍යසනයෙන් පසු ලංකාවට පැමිණි වර්ල්ඩ් කන්සර්න් ආයතනය එදා සිට පවුල් 113,000ක් සඳහා සිය සේවාවන් සලසා ඇත. අවතැන්වූ අවස්ථාවන්හිදි හදිසි ආපදා සහන ලබා දුන් අතර ඉන් පසු නැවත යථාතත්වයට පත්වීම සඳහා ජීවනෝපාය, ජලය හා සනීපාරක්‍ෂාව හා ආරක්‍ෂාව සම්බන්ධ වැඩ සටහන් මගින් ජනතාවට සරණ වූයේය. ත්‍රිකුණාමලයේ හා අම්පාර

ප්‍රදේශයේ නිවාස 144ක් ඉදිකළ ඔවුන් NEHRP හි අසම්පූර්ණ කර ඇති නිවාස 329 ක් සම්පූර්ණ කරන ලදී. ප්‍රජා විපත් අවදානම් අඩු කිරීමේ සැලසුම් සැකසීම සඳහා රජයේ විපත් කළමනාකරණ ඒකකය සමග ද කටයුතු කර ඇත. නැගෙනහිර ප්‍රදේශයේ යටිතලපහසුකම් බොහෝමයක් ද ඉදි කර ඇත. මේ සඳහා සංක්‍රාන්ති නිවාස 143ක්, විවිධ වර්ගයේ ළිං 1,350ක්, වැසිකිළි 900ක්, ධීවර යාත්‍රා 123ක්, අභ්‍යන්තර මාළු තොට 32ක්, ප්‍රජා මධ්‍යස්ථාන 4ක්, ජල පොම්ප කිරීමේ පද්ධති 3ක්, සූර්යබල පද්ධති 100ක් පමණ, එක් විශාල ප්‍රජා පාලමක්, ප්‍රජාව සඳහා පිවිසුම් මාර්ග හා ක්‍රීඩාභූමි අයත්වේ. මීට අමතරව වැඩිහිටියන් හා ළමුන් සඳහා මනෝසමාජීය හා සංස්කෘතික වැඩ සටහන් ද ගොවි ජනතාවගේ ආදායම් ශක්තිමත් කිරීම හා ඔවුන් වෙළඳ පොළ හා සම්බන්ධ කිරීමේ වැඩ සටහන් ද අයත් වේ. වැඩි විස්තර adminmb@wcsrilanka.org ඔස්සේ ලබා ගත හැකිය.

*වර්ල්ඩ් කන්සර්න් ආයතනය*

# මත්පැන් දුරලීමට කාන්තාවන්ගේ සහාය

කාන්තාවන් බොහෝවිට මත්පැන්, මත්කුඩු හෝ දුම්කොළ සඳහා ඇබ්බැහි වූවන් නොවූවද, ඔවුන් එම රුදුරු හස්තයේ සිරව සිටින්නේ අන් කිසිවකුත් නිසා නොව, ඊට ඇබ්බැහි වූ ඔවුන්ගේම ස්වාමිවරුන් හේතුවෙනි. දැඩි අර්ථික අපහසුතාවයන්ට මුහුණ පාන ඇය පවුලේ වේල පිරිමසා ගැනීමට මහත් වෙහෙසක් දරන්නීය. මෙය ඇයට ඉතා දුෂ්කර කාර්යයක් වන්නේ ඇය මුළුමනින්ම සිය ස්වාමියා මත යැපෙන බැවින් හා නිවසේ සිටින එකම බත සරිකරන්නා ඔහු වීමත් හේතුවෙනි. කෙතරම් ආර්ථික දුෂ්කරතා පැවතියද, මූලික අවශ්‍යතා ඉටු නොවී තිබුණද උපයන ආදායමෙන් වැඩි කොටසක් ගලා යන්නේ දුම්වැටි, මත්පැන් හා මත්කුඩු වෙනුවෙනි.

වීරයියාගේ නිවසේද තත්වය මෙයම විය. මාතලේ ප්‍රදේශයේ වෙසෙන ඔහු දැඩි ලෙස මතට ඇබ්බැහි වූවෙකි. ඔහුගේ මෙම ඇබ්බැහිවීම පවුලේ ආර්ථිකයට දරුණු ලෙස බලපෑ අතර ඔහුගේ මාසික වැටුප බලා සිටියදී අවසන් විය. ඔහුගේ ඉපයීම් මුළුමනින්ම පාහේ වැයවූයේ මත්පැන් හා දුම්කොළවලටයි. බිරිඳත් දරුවනුත් වෙනුවෙන් වැය කළේ ඉතා සුළු මුදලකි.

"එයා හැමදාම ගෙදර එන්නේ බීගෙන" අතීතයේ බියකරු මතකයන් අවදි කරමින් තිරුපති කීවාය. "එයා ගෙදරට ආ වෙලාවේ ඉඳන් මාත් එක්ක මොකක් හරි රණ්ඩුවක් පටන් ගන්නවා. ඊට පස්සේ දරුවො ඉස්සරහම මට හොඳටම ගහනවා. ඒ නිසා දරුවොත් ඉන්නේ කම්පනයෙන්." ඈ පැවසුවාය. වැඩිමල් පුතා ඔහුගේ අධ්‍යාපන කටයුතු අවසන් කිරීමටත් පෙර නිවසෙන් පිටව ගියේය. ඔහුගේ අවාසනාවන්ත ළමා කාලයේ අත්දැකීම් හේතුවෙන් නිවසෙන් කිලෝමීටර 140ක් ඈතින් පිහිටි කොළඹ නගරයට ඔහු පිටමං වූයේ රැකියාවක් සොයා ගැනීමේ අරමුණිනි.

මෙවැනි අත්දැකීම් පොදිබැඳ ගත්තේ වීරයියාගේ පවුල පමණක් නොවේ. කොළඹ අවට ප්‍රදේශයන්හි මෙවැනි පවුල් බොහෝය. පවුලේ එකම ආදායම් උත්පාදකයා පිරිමියා වන පවුල් ජීවන බරින් මිරිකී සිටින්න් ආදායමෙන් වැඩි කොටසක් මත්පැන් හා දුම්කොල වෙනුවන් වැය වන බැවිනි. මෙම තත්වයට ගොදුරුවන කාන්තාවන්ගේ දුක්ඛදෝමනස්සයන් ලොවට හඬ ගා නොකියන්නේ ඔවුන් හුදෙක් තම බීමත් ස්වාමියා මත යැපෙන බැවිනි.

වර්ථමානයේ අපගේ සමාජයේ ස්ත්‍රී පුරුෂ සම්බන්ධතා හා කාර්යභාර්ය මගින් කාන්තාව වඩාත් ආර්ථික වශයෙන් යැපෙන්නන් බවට පත්කරයි. නිවසේ විය හියදම් සඳහා ආර්ථික වශයන් දායක වන කාන්තාවන්ගේ ඉපයීම්වලින් ද යම් කොටසක් කෙසේ හෝ සිය ස්වාමියාගේ දුම්වැටි, පත්පැන්, හෝ කුඩු සඳහා වැය කිරීමට සිදුවන තත්වයන් උදා වී ඇත. ගෙදර වියදම් ඉහළ යන විට නිවස තුළ ඇති වන ගැටුම් ද ඉහළ යන්නේ ගෘහ ප්‍රචණ්ඩත්වයට මග පාදමිනි. ගෘහ ප්‍රචණ්ඩත්වයේදී මත් පැන් බොහෝ විට සමාවට කරුණක් ලෙස ඉදිරිපත් කෙරෙන අතර සමාජයද එය සමාව දිය යුතු සාධකයක් ලෙස දකී.

එවැනි ප්‍රජාවන් වෙත පියමං කළ ෆෝරුට් ශ්‍රී ලංකා ආයතනය, කාන්තාවන් විසින් සිදු කළ හැකි, මූලික වශයෙන් ආකල්ප වෙනස්කිරීම මගින් මත්පැනට ඇබ්බැහි වීම අඩු කිරීමට හෝ නවතා දැමීමට හැකි අවස්ථා හඳුනා ගැනීම ආරම්භ කළේය. මේ අනුව නිවසේ පිරිමින් වඩාත් ඵලදායී ක්‍රියාකාරකම් කෙරෙහි යොමු කිරීමත් එමගින් ගෙදර ආදායම ශක්තිමත් කිරීමටත් සාමය රැකගැනීමටත් සිදු විය.

වීරයියාගේ පවුල මෙසේ ෆෝරුට්හි අවධානය යොමු වූ එක් පවුලකි. ෆෝරුට් කණ්ඩායමට වීරයියා අභියෝගාත්මක චරිතයක් වූවද ඔවුන් ඔවුන්ගේ උත්සාහය නම් අත හැරියේ නැත. අවසානයේ වීරයියා සිය නිවසේ ගෙවතුවගාව කෙරෙහි යොමු වූයේ ෆෝරුට් කණ්ඩායමේ නොමඳ උත්සාහයේ මල්ඵල දරමිනි. අද වැඩ ඇරී නිවස බලා එන වීරයියා මහත් උද්‍යෝගයෙන් සිය ගෙවතු වගාවට සාත්තු කිරීමට ඉතිරි කාලය යොදවන්නේය. වෙනදා අරක්කු සිගරට් වලට හිමි තැන අද ලැබෙන්නේ කැරට් හා අර්තාපල්වලටය.

අද දක්වා ෆෝරුට් ආයතනය කාන්තාවන් බලගැන්වීමේ කාර්යයයෙහි නිරතවෙයි. වැඩමුළු හා සම්මන්ත්‍රණ මාලාවක් ජාතික හා දිස්ත්‍රික්ක මට්ටමෙන් සංවිධානය කර ඇති අතර ඒ සඳහා බිම් මට්ටමේ හා දිස්ත්‍රික්ක මූල කාන්තා සංවිධාන සහභාගී වෙයි. කාන්තා සංවර්ධනය හා මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳ ජාති සම්මන්ත්‍රණයක් මෑතකදී කොළඹ ශ්‍රී ලංකා පදනම් ආයතනයේදී පැවැත් වුනු අතර ඒ සඳහා ලංකාව පුරා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්ගේ සහාය ද ලැබිණි.

මේ සඳහා සහභාගීවූවන් මෙම පණිවිඩය ඔවුන්ගේ කාර්යාල පරිසරය වෙත රැගෙන ගොස් ප්‍රජා මට්ටමෙන් කාන්තාවන් බලගැන්වීමේ කාර්යයක නිරතවන්නේයැයි ෆෝරුට් අපේක්ෂා කරයි. "අපගේ උත්සාහයන් මගින් අවට ප්‍රදේශයන්හි වෙසෙන කාන්තාවන්ට උපකාරයක් වූයේයැයි අප බලාපොරොත්තු වනවා. මත්පැන් හා මත්කුඩු නිවාරණයේදී කාන්තාවන්ට ද යම් කාර්යභාර්යයක් ඉටු කළ හැකි බව ඔවුන්ට අවබෝධ කරවීමටයි අපට උවමනා වූයේ. මත්ද්‍රව්‍ය හා සම්බන්ධ අසාධාරණ හිමිකම් සඳහා සාහයදීමෙන් වැළකීම පමණයි ඔවුන් කළ යුතුවූයේ. මත්ද්‍රව්‍ය හා මත්පැන් භාවිතය ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය හා පිරිමිකම අතර ඇති බැඳීම බිඳ දැමිය යුතු අතර මෙය කළ හැක්කේ සමස්ථ ආකල්ප වෙනස්කිරීමෙන් හා සත්‍ය බලගැන්වීමකිනි." යි ෆෝරුට් ශ්‍රී ලංකා ආයතනයේ ස්ත්‍රී පුරුෂ සමාජබාවය පිළිබඳ උපදේශක සමිතා සුගතමාලා පැවසුවාය.

"බොහෝ බිම් මට්ටමේ කාන්තා සංවිධානයන්ට මත්පැන් නිවාරණය හා ස්ත්‍රී පුරුෂ සාමජබාවය මූලික වූ ප්‍රචණ්ඩත්වය පිළිබඳ ගැටලු හසුරවාලීම සම්බන්ධ දැනුම හා කාර්යක්ෂම යන්ත්‍රණයන් නැහැ. දෙදින ජාතික සම්මන්ත්‍රණයේදී සහභාගී වුවන් සාකච්ඡා මාලාවක් කෙරෙහි යොමු කෙරුණා. ඉන් අලුත් විදිහට සීතිමට ඔවුන් යොමූ වූවා." ඇය තව දුරටත් පැවසුවාය.

*ඇන්ටනෙට් ලූඩොවික්*
*කළමණාකාර-තොරතුරු හා සන්නිවේදන*
*ෆෝරුට් ශ්‍රී ලංකා*
***www.forut.lk***

 

*පළමු වන පිටුවෙන්...*

2005 වසරේ අමෙරිකා එක්සත් ජනපදයේ ඩියුක් විශ්ව විද්‍යාලයේ ඉතිහාස අංශයේ සේවයේ නියුතු මහාචාර්යවරුන් දෙදෙනෙකු වන සුචේතා මජුම්දාර් සහ වසන්ත් කයිවාර් යුවල සුනාමියට ගොදුරු වූ ප්‍රදේශවල පිහිටි විශ්ව විද්‍යාල පුස්තකාලවල භාවිතය සඳහා පොත් පරිත්‍යාග කිරීමට මැදිහත් වූහ. මෙවැනිම වැඩසටහන් ඔවුන් බොස්නියාව හා ඉරාකය වෙනුවෙන් ද දියත් කොට තිබිණ. එහෙත් ශ්‍රී ලංකාව වෙනුවෙන් එකතු වූ පොත් ප්‍රමාණය ඔවුන් මවිත කරන සුළු විය. මෙම පොත් සැප්තැම්බර් මාසයේ 21 වන දින ගාල්ල කරාපිටියේ පිහිටි රුහුණු විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨ පුස්තකාලයට බාර දෙනු ලැබීය. අනතුරුව නැගෙනහිර විශ්ව විද්‍යාලයටත්, යාපනය විශ්ව විද්‍යාලයටත්, වටිනා පොත් විශාල ප්‍රමාණයක් බාර දෙනු ලැබීය. ඒ පොත් ප්‍රමාණය පොත් 15,000කට අධිකය.

මීට අමතරව එම ආචාර්යවරුන් දෙදෙනා සමාජ විද්‍යාඥයින්ගේ සංගමයෙහි සමාජ විද්‍යාව පිළිබඳ විශේෂ එකතුවක් ආරම්භ කිරීම සඳහා ද පොත් විශාල ප්‍රමාණයක් පරිත්‍යාග කළහ. සමාජ විද්‍යාව පිළිබඳ ඩියුක් එකතුව යනුවෙන් හැඳින්වෙන එම එකතුව සහකාර පුස්තකාලාධිපතිනිය වශයෙන් කටයුතු කරන නයෝමි රාජපක්ෂ මහත්මියගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වෙයි.

2006 වසරේ ආරම්භ කරන ලද තොරතුරු හුවමාරු කරගැනීමේ සිවිල් සමාජ ජාලය (Civil Society Network on Information Sharing - CSNIS) බිහිකිරීමේ දී ආරම්භක සාමාජිකයන් අතරට සමාජ විද්‍යාඥයින්ගේ සංගමයේ පුස්තකාලය ද එක් විය.

විශේෂ පුස්තකාල දැනුවත්කරණ වැඩ සටහනක් ආයතනික මට්ටමින් පවත්වා ගනිමින් පුස්තකාල කාර්ය මණ්ඩල හැකියා වර්ධනය කරගැනීම පුස්තකාල උපදේශක ඒ. වක්කුඹුර මහතාගේ ප්‍රධානත්වයෙන් සිදු කෙරේ. මේ අතර විශේෂ පුස්තකාල එකතූන් කළමණාකරණය සඳහා ඩිලාන් ගොඩපිටිය මහතා සහය වෙයි.

මේ අතර පුස්තකාලයේ සම්පත් ප්‍රමාණය ද ක්‍රමයෙන් වර්ධනය වෙමින් ඊට නව ප්‍රදානයන් ගණනාවක් ද එක් වූයේය. ආචාර්ය කුමාරි ජයවර්ධන මහත්මියගේ, අභාවප්‍රාප්ත ආචාර්ය නිව්ටන් ගුණසිංහ මහතාගේ, ආචාර්ය එස්. බී. ඩී, සිල්වා මහත්මාගේ පෞද්ගලික පුස්තකාල එකතූන් පෞද්ගලික පරිත්‍යාගයක් වශයෙන් ලද අතර එය ද සමාජ විද්‍යාඥයින්ගේ සංගමයට එක් කරන ලදී.

මේ අතර තොරතුරු හුවමාරු කරගැනීමේ සිවිල් සමාජ ජාලය බිහිකිරීමේ පුරෝගාමීත්වය ගනු ලැබූ ගැටුම් නිරාකරණය පිළිබඳ බර්ගොෆ් ආයතනය සිය සේවා කාලය අවසන් කරන අවස්ථාවේ දී ඔවුන් පරිහරණය කරන ලද ආයතනික පුස්තකාලය සහ එහි සියළුම පුස්තකාල සම්පත් CSNIS තොරතුරු ජාලය සමග බද්ධ වී කටයුතු කිරීමේ සහ වඩා වැඩි පාඨක ප්‍රජාවක් සඳහා සම්පත් බෙදාහැරීමක් සිදු කළ හැකි බැවින් ද හා සමාජ විද්‍යාඥයින්ගේ සංගමය සමග ඔවුන් වෙත පැවති ආයතනික අවබෝධය හේතුකොට පරිත්‍යාගයක් වශයෙන් භාර දීම සිදු කරන ලදී. එම එකතුව ද ගැටුම් නිරාකරණය පිළිබඳ විශේෂ එකතුවක් ලෙසින් පාඨක ප්‍රජාවට විවෘතව පවතී.

*එම් රෝහණ වසන්ත*
*සමාජ විද්‍යාඥයින්ගේ සංගමය*
***www.ssalanka.org***

*ඔබ වෙනුවෙන් ම වූ මෙම පුවත් සඟරාව පිළිබඳ ඔබගේ අදහස්, යෝජනා හා ලිපි අපි අගය කොට සලකමු.*

CONSORTIUM OF CHA HUMANITARIAN AGENCIES (GTE) LIMITED

මානුෂීය සේවායතන සමූහය
අංක 86
රොස්මිඩ් පෙදෙස
කොළඹ 7
දුරකථන: 011 4610943/4
ඊමේල්: feedback@cha.lk
වෙබ් අඩවිය : www.humanitarian-srilanka.org